# 2025 / 2026 වර්ෂයේ බස්නාහිර පළාත තුල රසවින්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම

---

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත Clean Sri Lanka ව්‍යාපෘතියට සමගාමීව බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් පාරිසරික, සමාජීය හා ආචාරධර්මීය වශයෙන් පොහොසත් මිනිසෙකු හා ලස්සන රටක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කරනු ලබන රසවින්දන වැඩසටහන් සඳහා සුදුසුකම්ලත් ප්‍රවීණ සම්පත්දායකයින් ලියාපදිංචිකරගනු ලැබේ.

ඒ සඳහා පහත ආකෘතිය ප්‍රකාරව ඔබගේ තොරතුරු යොමු කළ යුතුය.

| නම | ලිපිනය | තනතුර | කලා ක්ෂේත්‍රය | සම්පත්දායකයකු වශයෙන් ඇති අත්දැකීම් | Whats App Number |
|---|---|---|---|---|---|
| | | | | | |

අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගන්නා අයදුම්කරුවන් 2025 වර්ෂයේ ජුලි, අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මාසයන් සඳහා සහ 2026 වර්ෂයේ බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රසවින්දන වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස ලියාපදිංචි කරගනු ලැබේ.

උක්ත ආකෘතියට අදාළ තොරතුරු 2025.07.11 දිනට පෙර ලේකම්, බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, නො.204, 02 වන මහළ, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (minculturalwp@gmail.com) හෝ අප අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය වෙත අතින් ගෙනවිත් හෝ භාරදිය හැකිය.

**ලේකම්,**

**අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**බස්නාහිර පළාත**

**2025.06.27**